# සිව්වැනි කොටස

## මහ බැංකුවේ හා ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ

## 1986 ප්‍රධාන නීති අනපනත්

පිටුව


(1) 1986 අංක 27 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත ... ... I

(2) 1986 අංක 32 දරණ මහජන බැංකු (සංශෝධන) පනත ... ... II

(3) 1986 අංක 45 දරණ විසර්ජන පනත ... ... ... XVIII

# 1986 අංක 27 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

**1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1986 අංක 27 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු '' ප්‍රධාන ප්‍රඥප්තිය '' යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ ඡේදයේ (XLVIII) වන අනුඡේදයේ '' මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව.''. යන වචන වෙනුවට '' මහා කොළඹ අර්ථික කොමිෂන් සභාව;'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ ඡේදය අගට දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

'' (XLIX) 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතින් පිහිටුවන ලද ජනාධිපතිවරයාගේ අරමුදල.''.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (ඣ) ඡේදයෙහි '' තැනැත්තකුට උද්ගත වන ලාභ සහ ආදායම.'' යන වචන වෙනුවට '' තැනැත්තකුට උද්ගත වන ලාභ සහ ආදායම;'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තිය අගට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

''(ත) 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතින් පිහිටුවන ලද ජනාධිපතිවරයාගේ අරමුදලින් තැනැත්තකුට ලැබුණු යම් මුදලක්.''.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියේ (ඣ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (ඤ) 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතින් පිහිටුවන ලද ජනාධිපතිවරයාගේ අරමුදලට ;''.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ ''ආණ්ඩුවට හෝ යම් පළාත් පාලන ආයතනයකට'' යන වචන වෙනුවට '' ආණ්ඩුවට හෝ 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතින් පිහිටුවන ලද ජනාධිපතිවරයාගේ අරමුදලට හෝ යම් පළාත් පාලන ආයතනයකට'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. මේ පනතේ 2 වන, 3 වන, 4 වන සහ 5 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

# 1986 අංක 32 දරන මහජන බැංකු (සංශෝධන) පනත

**1961 අංක 29 දරන මහජන බැංකු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

1. මේ පනත 1986 අංක 32 දරන මහජන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 4 වන සහ 5 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ :—

''බැංකුවේ පරමාර්ථ

4. (1) (අ) ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය ;

(ආ) ග්‍රාමීය බැංකු කටයුතු ;

(ඇ) කෘෂිකර්මාන්තය ; සහ

(ඈ) කර්මාන්ත

සංවර්ධනය කිරීම සහ ඒවාට සහාය දීම ; සහ

(2) (අ) වානිජ බැංකුවක ;

(ආ) බඩු උකස් ගන්නකුගේ ; සහ

(ඇ) වෙළෙඳ බැංකුවක

ව්‍යාපාරය පවත්වා ගෙන යාම බැංකුවේ පරමාර්ථ විය යුතු ය.

බැංකුවේ බලතල

5. (1) ස්වකීය පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී, මේ වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල දක්වා ඇති පරිසීමාකිරීම්වලට, සුදුසුකම්වලට සහ සීමාකිරීම්වලට යටත්ව, බැංකුව විසින් පහත දැක්වෙන සියලු බලතල, ක්‍රියා සහ දේවල් හෝ ඉන් කිසිවක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම කරනු ලැබිය හැකි ය :—

(අ) ස්වකීය සියලු ශාඛා සහ දෙපාර්තමේන්තු ඇතුළත බැංකු ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ සහ වෙනත් ස්ථානවල පිහිටුවීම, පවත්වාගෙන යාම, සංවර්ධනය කිරීම සහ ව්‍යාප්ත කිරීම ;

(ආ) කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන ණය, අයිරා, අත්තිකාරම් සහ වෙනත් අනුග්‍රහ දීම ;

(ඇ) (i) ජංගම ගිණුම්, තැන්පත් ගිණුම්, ඉතිරි කිරීමේ ගිණුම් සහ වෙනත් ගිණුම් විවෘත කිරීම, පවත්වා ගෙන යාම සහ කළමනාකරණය කිරීම ;

(ii) පවරනු ලැබිය හැකි හෝ ගනුදෙනු කරනු ලැබිය හැකි වුව ද නැතහොත් පවරනු ලැබිය නොහැකි හෝ ගනුදෙනු කරනු ලැබිය නොහැකි වුව ද විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු, හුන්ඩි, පූර්ජා, කූපන් පත්‍ර, අණකර, නෞභාර පත්‍ර, බලපත්‍ර, ණයපත්‍ර, සහතික, කොටස්කර සහ වෙනත් සාධනපත්‍ර හා සුරැකුම්පත් වට්ටම්දීම, මිලට ගැනීම, විකිණීම සහ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම ;

(iii) ණයවර ලිපි සහ චක්‍රලේඛ සටහන් පත්‍ර ප්‍රදානය කිරීම සහ නිකුත් කිරීම ;

(iv) රන් හා එවැනි වර්ග මිලට ගැනීම, විකිණීම සහ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ ඒවා හුවමාරු කර ගැනීමේ ක්‍රියාකාරකම්වල නිරත වීම ;

(v) ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් ගනුදෙනු කිරීම, තැන්පතු මත හෝ ආරක්ෂිත භාරය සඳහා හෝ අන්‍යාකාරයෙන් හෝ මුදල්, සුරැකුම් පත් සහ වටිනා දේ භාර ගැනීම ;

(vi) මුදල් සහ සුරැකුම්පත් එකතු කිරීම හා ප්‍රේෂණය කිරීම ;

(ඇ) දේපළ කළමනාකරණය කිරීම සහ බැංකුකරුවන් විසින් සාමාන්‍යයෙන් කටයුතු කරනු ලබන යම් වර්ගයක අනුයෝජිත ව්‍යාපාර කටයුතු කිරීම ;

(ඉ) සුදුසු යයි බැංකුව විසින් අදහස් කරනු ලබන ආකාරයකින් මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම සහ කැඳවනු නොලැබූ බැංකුවේ ප්‍රාග්ධනය ඇතුළුව දැනට ඇති නැතහොත් ඉදිරියේ දී ඇතිවන වුව ද බැංකුවේ සම්පූර්ණ දේපළ හෝ වත්කම් හෝ ඉන් යම් කොටසක් මත උකසක්, වැයබරක් හෝ කැප අයිතියක් මගින් ණයට ගන්නා ලද, ලබා ගන්නා ලද හෝ ගෙවිය යුතු යම් මුදලක් ආපසු ගෙවීම සුරක්ෂිත කිරීම, තවද බැංකුව විසින් භාරගනු ලබන යම් බැඳීමක් හෝ වගකීමක් බැංකුව විසින් ඉටු කරනු ලැබීම ඒ සමාන උකසක්, වැයබරක් හෝ කැප අයිතියක් මගින් සුරක්ෂිත කිරීම සහ සහතික කිරීම ;

(ඊ) අවස්ථානුකූල යයි පෙනී යන නියමයන් මත සහ ඇප ඇතිව හෝ නොමැතිව ද ඇප ඇතිව නම් සුදුසු යයි කලින් කල සලකනු ලබන ඇප සහ කොන්දේසි මත තැනැත්තන්ට, ව්‍යාපාර ආයතනවලට හෝ සමාගම්වලට මුදල්, සුරැකුම්පත් සහ දේපළ ණයට දීම සහ අත්තිකාරම් දීම, හෝ බැර සැලසීම ;

(උ) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ ශ්‍රී ලංකාවෙහි ලියාපදිංචි වූ හෝ ශ්‍රී ලංකාවෙහි ස්වකීය ප්‍රධාන ව්‍යාපාර ස්ථානය ඇත්තා වූ යම් සමාගමක් හෝ සංස්ථාවක් විසින් නිකුත් කරන ලද හෝ සහතික කරන ලද ස්කන්ධ, කොටස්, ණයපත්‍ර, උකස්,

බැඳුම්කර හෝ සුරැකුම්පත් මිලට ගැනීම, විකිණීම, ඒ මත ආයෝජනය කිරීම, සහතික වීම, ඒ පිළිබඳ කටයුතු කිරීම සහ ඒවා බැහැර කිරීම :

එසේ වුව ද බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයාගේ නිර්දේශය මත සහ බැංකුවේ අධ්‍යක්ෂවරයන්ගේ රැස්වීමක දී ඒ අධ්‍යක්ෂවරයන්ගෙන් පහෙන් තුනක සංඛ්‍යාවකට අඩුනොවන සංඛ්‍යාවකින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතයකින් දෙනු ලැබූ බැංකුවේ අධ්‍යක්ෂවරයන්ගේ අනුමතය ඇතිව හැර එවැනි යම් සමාගමක් හෝ සංස්ථාවක් විසින් නිකුත් කරන ලද හෝ සහතික කරන ලද ස්කන්ධ, කොටස්, සෘණ පත්‍ර, උකස්, බැඳුම්කර හෝ සුරැකුම්පත් කෙරෙහි බලපාන යම් ගනුදෙනුවකට බැංකුව ඇතුළු නොවිය යුතු ය. තවද අධ්‍යක්ෂවරයන්ගේ ඒ රැස්වීමේ දී ඔවුන් අතුරින් යම් අධ්‍යක්ෂවරයකු ඒ සමාගමේ හෝ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ කොටස්කරුවකු වන විට නැතහොත් ඔවුන් අතුරින් යම් අධ්‍යක්ෂවරයකුගේ භාර්යාව හෝ යැපෙන දරුවා ඒ සමාගමේ හෝ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ කොටස් කරුවකු වන විට හෝ ඒ අධ්‍යක්ෂවරයා යෝජනා සම්මතය සැලකිල්ලට භාජනය කරනු ලබන කාලය තුළ පැමිණ නොසිටිය යුතු අතර යෝජනාවට ඡන්දය නොදිය යුතුය;

(ඌ) යම් වංචල හෝ නිශ්චල දේපළ සහ යම් අයිතිවාසිකම් හෝ වරප්‍රසාද මිල දී ගැනීම, බද්දට ගැනීම හෝ හුවමාරුවට ගැනීම, කුලියට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම ;

(එ) නිශ්චල හෝ වංචල දේපළ කිසිවක් උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, බද්දට දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඒ) කරගෙන යාමට හෝ නිරත වීමට බැංකුවට බලය දෙනු ලැබ ඇත්තා වූ යම් ව්‍යාපාරයක් හෝ ගනුදෙනුවක් කරගෙන යන්නා වූ හෝ එහි නිරත වූ යම් තැනැත්තකු හෝ සමාගමක් සමග ලාභ කොටස් බෙද ගැනීම සඳහා, සම්බන්ධතා ඇත්තවුන්ගේ එක්වීමක් සඳහා, සහයෝගතාවය සඳහා, හවුල් පරිශ්‍රමයක් සඳහා, අන්‍යෝන්‍ය අනුග්‍රහයක් සඳහා හෝ අන්‍යාකාරයෙන් යම් සංවිධානයකට ඇතුළත් වීම ;

(ඔ) භාරගැනීම යෝග්‍ය යයි පෙනී යන භාර කිසිවක් භාරගෙන ක්‍රියාවේ යෙදවීම සහ පොල්මඃකරුවකුගේ, අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ, භාරගන්නකුගේ, භාණ්ඩාගාරිකයකුගේ, හෝ රෙජිස්ට්‍රාර්වරයකුගේ ධුරය භාර ගැනීම සහ යම් ස්කන්ධ, මුදල්, කොටස් හෝ සුරැකුම්පත්වලට අදළ යම් ලේඛනයක්, යම් සමාගමක්, ආණ්ඩුවක්, අධිකාරියක් හෝ මණ්ඩලයක් වෙනුවෙන් පවත්වාගෙන යාම නැතහොත් පැවරීම් ලියාපදිංචි කිරීමට, සහතික නිකුත් කිරීමට හෝ අන්‍යාකාර අදළ වන යම් කාර්ය භාර ගැනීම ;

(ඕ) බැංකුවේ සේවා නියුක්තයන්ට හෝ හිටපු සේවා නියුක්තයන්ට හෝ ඒ සේවා නියුක්තයන්ගේ යැපෙන්නන්ට, උරුමක්කාරයන්ට ප්‍රතිලාභයක් ගෙනදීම අරමුණු කර ගන්නා ලද සංගම්, ආයතන, භාර, අර්ථසාධක අරමුදල්, විශ්‍රාම වැටුප් සහ සහතික කිරීම් සැලසීම සඳහා ක්‍රම සහ වෙනත් අරමුදල් හා පහසුකම් පිහිටුවීම සහ ඒවාට ආධාරදීම හෝ ඒවා පිහිටුවීමෙහිලා සහායවීම හා ඒවාට ආධාරදීමෙහි ලා සහායවීම සහ විශ්‍රාම වැටුප් සහ දීමනා ප්‍රදානය කිරීම සහ ඔවුන් රක්ෂණය කිරීම උදෙසා ගෙවීම් කිරීම් සහ පුණ්‍ය හෝ හිතකාමී අරමුණු සඳහා හෝ යම් ප්‍රදර්ශනය කිරීමක් සඳහා හෝ යම් පොදු, සාමාන්‍ය හෝ ප්‍රයෝජනවත් අරමුණක් සඳහා මුදලින් දායක වීම හෝ ඇපවීම ;

(ක) බැංකුවට අයත් හෝ බැංකුව විසින් බද්දට ගන්නා ලද යම් ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීම සහ බැංකුවේ සියලු දේපළ සහ අයිතිවාසිකම් හෝ ඉන් යම් කොටසක් වැඩිදියුණු කිරීම, කළමනාකරණය කිරීම, සංවර්ධනය කිරීම, හුවමාරු කර ගැනීම, බද්දට දීම, උකස් කිරීම, බැහැර කිරීම, විකිණීම, ප්‍රයෝජනයට ගැනීම හෝ ඒවා සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් කටයුතු කිරීම ;

(ග) ප්‍රධානයන්, අනුයෝජිතයන්, කොන්ත්‍රාත්කරුවන්, භාරකරුවන් හෝ අන්‍යාකාරයන් වශයෙන් ශ්‍රී ලංකාව ඇතුළත දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී ඉහත සඳහන් සියලු දේවල් හෝ ඒවායින් යම් දෙයක් කිරීම සහ භාරකරුවන්, අනුයෝජිතයන් හෝ අන්‍යාකාරයන් විසින් හෝ ඔවුන් මගින් තමා විසින්ම හෝ වෙනත් තැනැත්තන් සමග සම්බන්ධව ඉහත සඳහන් සියලු දේවල් හෝ ඒවායින් යම් දෙයක් කිරීම ;

(ච) බැංකුවේ විශ්වාසනීයත්වය තහවුරු කිරීමේ සහ එය සනාථ කිරීමේ කාර්යය සඳහා අවස්ථානුකූල යයි පෙනී යන සියලු පියවර හා ක්‍රියා මාර්ග ගැනීම හෝ ගැනීමට එකඟවීම, සහ මහජන විශ්වාසය ලබා ගැනීම සහ එය යුක්ති යුක්ත කිරීම සහ බැංකුව කෙරෙහි බලපෑ හැකි මූල්‍ය කරදර වැළැක්වීම හෝ අවම බවට පත් කිරීම ;

(ජ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් රටක දී ඒ බැංකුව ලියාපදිංචි කිරීම හෝ පිළිගැනීම පහසු කිරීම ;

(ට) යම් සහතික කිරීමක් හෝ හානි පූරණ දීම සහ බැංකුව විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යම් අයිතිවාසිකම්, වරදාන සහ වරප්‍රසාද ලබා ගැනීම පිණිස යම් ආණ්ඩුවක් හෝ පළාත් පාලන ආයතනයක් සමග යම් වැඩ පිළිවෙළවලට ඇතුළුවීම ;

(ඩ) යම් ව්‍යාපාරයක නිරත වීමට බැංකුවට අවසර දෙනු ලැබ ඇත්තා වූ ඒ ව්‍යාපාරය කරගෙන යැම සඳහා හෝ යම් ව්‍යාපාරයකට සහායවීම හෝ යම් ව්‍යාපාරයක් සංවර්ධනය කිරීම සඳහා

හෝ බැංකුවේ යම් දේපළක වටිනාකම වැඩි කිරීම සඳහා හෝ යම් සමාගමක් පිහිටුවීම සහ යම් සමාගමක් පිහිටුවීමට බැංකුවට බලය දෙනු ලැබ ඇත්තේ යම් අරමුණු සඳහා ද ඒ අරමුණුවලට සමාන අරමුණු ඇති යම් සමාගමක ව්‍යාපාරය අත්කර ගැනීම සහ එය භාර ගැනීම, එහි යම් සම්බන්ධතාවක් මිලට ගැනීම හෝ එහි ස්කන්ධ හෝ කොටස් අත්කර ගැනීම හෝ දැරීම ;

(ඞ) බැංකුවේ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම ;

(ක) බැංකුවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවා කොන්දේසි සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ විනය පාලනය සඳහා රීති සෑදීම ;

(ද) ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(න) නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව, බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යාම ;

(ප) යම් ණයක්, අයිරාවක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහයක් බැංකුව විසින් ප්‍රදානය කරනු ලබන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට කාර්මික සහාය සැලැස්වීම සහ ඉඩම්වල වටිනාකම හා ණය ගැනුම්කරුවන්ගේ ණය ගැනීමට ඇති සුදුසුකම තක්සේරු කිරීම, රත්රන්වල මාත්තු බැලීම සහ බැංකු හා මුදල් කටයුතු සම්බන්ධයෙන් තැනැත්තන් පුහුණු කිරීම භාර ගැනීම හෝ සමනුග්‍රහ කිරීම ;

(බ) කාර්මික සහ කෘෂිකාර්මික ව්‍යවසායන් විසින් අනුමත කළ ණය ආයතනවලින් ලබා ගන්නා ලද හෝ ලබාගත යුතු ණය සඳහා ඇපවීම ;

(ම) බැංකුවට බලය දී ඇත්තේ යම් ව්‍යාපාරයක් කරගෙන යාමට ද ඒ ව්‍යාපාරය කරගෙන යන යම් තැනැත්තකුගේ හෝ සමාගමක බැංකු ව්‍යාපාරය සහ වට්ටම් ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් හෝ අත්කර ගැනීම සහ භාර ගැනීම :

එසේ වුව ද බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයාගේ ලිඛිත නිරීක්ෂණ සලකා බැලීමෙන් පසුව යටත්පිරිසෙයින් බැංකුවේ අධ්‍යක්ෂවරයන් සතර දෙනකු විසින් දෙන ලද අනුමතයට යටත් ව, සහ අමාත්‍යවරයා විසින් කලින් දෙන ලද ලිඛිත අනුමතය ඇතිව ඉහත සඳහන් බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය ;

(ය) සුදුසු යයි බැංකුව විසින් සලකනු ලබන ප්‍රතිෂ්ඨාවක් සඳහා සහ විශේෂයෙන් ම, වෙනත් යම් බැංකුවක කොටස්, සෘණපත්‍ර හෝ සුරැකුම් පත් සඳහා බැංකුවේ සම්පූර්ණ ව්‍යාපාරය හෝ එහි යම් කොටසක් විකිණීම, බැහැර කිරීම නැතහොත් වෙනත් යම් බැංකුවක ව්‍යාපාරය සමග බැංකුවේ ව්‍යාපාරය ඒකාබද්ධ කිරීම :

එසේ වුව ද බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයාගේ ලිඛිත නිරීක්ෂණ සලකා බැලීමෙන් පසුව යටත්පිරිසෙයින් බැංකුවේ අධ්‍යක්ෂවරයන් සතර දෙනකු විසින් දෙන ලද අනුමතයට යටත්ව සහ අමාත්‍යවරයා විසින් කලින් දෙන ලද ලිඛිත අනුමතය ඇතිව ඉහත සඳහන් බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය ;

(අඅ) කුලී සිත්තක්කර ව්‍යාපාර කටයුතුවල නිරතවීම සහ වට්ටම්, කොමිස් මුදල් සහ වෙනත් පාරිශ්‍රමික භාරගැනීම ; සහ

(ආආ) බැංකුවේ සියලු අරමුණු හෝ ඒවායින් කිසිවක් සාක්ෂාත් කර ගැනීමට ආනුෂංගික හෝ හිතකර සියලු දේ හෝ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු දේ කිරීම.

(2) පද සම්බන්ධයෙන් ප්‍රකාශිතව ම නියම කොට ඇති අවස්ථාවක හැර, (1) වන උපවගන්තියේ විධිවිධාන, වෙනත් යම් ඡේදයක ඇතුළත් විධිවිධානවලට හෝ ඒ වෙනත් ඡේදයක සඳහන් යම් බලයකට යොමු කිරීමෙන් හෝ එයින් නිගමනය කිරීමෙන් කිසිම ආකාරයකින් සීමා කිරීම හෝ පරිසීමා කිරීම කරනු නොලැබිය යුතු ය. තවද එවැනි ඡේදයක් මගින් පවරන ලද බලතල (1) වන උපවගන්තියෙහි සඳහන් බලතලවලට හුදෙක් අනුයාත හෝ උපකාරක වන්නේ යයි සලකනු නොලැබිය යුතු අතර, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් ප්‍රකාශිතවම නියම කර ඇති අවස්ථාවක හැර, (1) වන උපවගන්තියේ යම් ඡේදයකින් පවරන ලද සියලු බලතල හෝ ඉන් කිසිවක් හෝ ශ්‍රී ලංකාව ඇතුළත හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් රටක දී ක්‍රියාත්මක කිරීමට බැංකුවට සම්පූර්ණ බලතල ඇත්තේ ය.

(3) පහත දැක්වෙන පරිසීමා කිරීම්වලට සහ සුදුසුකම්වලට යටත් ව, බැංකුවේ ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබිය යුතු ය :—

(අ) බැංකුවේම කොටස් මිලට ගැනීම හෝ ඒවා පිළිබඳව කටයුතු කිරීම සම්බන්ධයෙන් බැංකුවේ මුදල් වියදම් කරනු නොලැබිය යුතු ය. තව ද බැංකුවේම කොටස්වල ඇපය මත ඒ මුදල් ණයට දෙනු නො ලැබිය යුතු ය ;

(ආ) බැංකුවේ වෙනත් සේවානියුක්තයකුට හැර, බැංකුවේ සේවා නියුක්තයකුගේ ඇප සහතිකය මත බැංකුව විසින් යම් තැනැත්ත-කුට ණයක්, අයිරාවක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහයක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

(4) (1) වන සහ (2) වන උපවගන්තිවල අඩංගුවන සියලු බලතල, (3) වන උපවගන්තියේ දක්වා ඇති පරිසීමා කිරීම්වලට සහ සුදුසුකම්වලට යටත්ව කියවා තේරුම් ගත යුතු ය. තව ද යම් ගැටීමක් හෝ අනනුකූල-තාවයක් වෙතොත් මේ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

(5) බැංකුව විසින් බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යන විට (90 වන අධිකාරය වූ) බඩු උකස් ගන්නන්ගේ ආඥාපනත බැංකුව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.''.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

'' ගෙවීම පැහැර හැරීම හා පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩන පොලිය.

29. (1) චංචල හෝ නිශ්චල දේපළක උකසක් මත බැංකුව විසින් ප්‍රදානය කරනු ලැබූ යම් ණයක්, අයිරාවක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහයක් මත ලැබිය යුතු යම් මුදලක් ගෙවීමේ දී පැහැර හැරීමක් කරනු ලැබූ අවස්ථාවක, ඒ මුදල ලැබිය යුත්තේ මුල් මුදල වෙනුවෙන් ද නැතහොත් පොලිය වෙනුවෙන් ද නැතහොත් ඒ දෙකම වෙනුවෙන් ද, ඒ ණය, අයිරාව, අත්තිකාරම හෝ ඒ වෙනත් අනුග්‍රහය සම්බන්ධයෙන් ඒ අවස්ථාවේ දී නොගෙවා ඉතිරිව ඇති ඒ කොටස සහ පැහැර හැරීමේ දිනය දක්වා ඒ මත ලැබිය යුතු පොලිය සම්බන්ධයෙන් පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) බැංකුව විසින් ණයක් සුරැකුම් කිරීම පිණිස වූ යම් සාධන පත්‍රයකින් ණය සම්බන්ධයෙන් එවක ලැබිය යුතු වූ, අවස්ථාවෝචිත පරිදි, වාරිකය සහ පොලිය නියමිත දින ගෙවීමට හෝ සැමයු ගෙවීමක් හෝ වෙනත් ගෙවීමක් කිරීමට ණය ගැනුම්කරු විසින් පැහැර හරිනු ලැබුවහොත්, හෝ නොසලකා හරිනු ලැබුවහොත්, එවිට ණය දෙනු ලැබුවේ යම් පොලියක් මතද ඒ පොලිය ඉක්මවමින් නියම කරනු ලබන අනුප්‍රමාණයක් අනුව එම ණය මත පොලිය ගෙවිය යුතු බවට විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය :

එසේ වුවද, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල සඳහන් නියමිත අනුප්‍රමාණය අනුව පොලිය ගෙවීම මණ්ඩලය විසින් ස්වකීය පරම අභිමතය අනුව අත් හැරිය හැකි අතර, ඒ වෙනුවට වාරිකය ලැබිය යුතු වූ දිනයෙන් ආරම්භ වන සහ වාරිකය ගෙවන ලද දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා පැහැර හරින ලද වාරිකය මත එකඟ වූ අනුප්‍රමාණය මෙන් දෙගුණයක් දක්වා පොලිය ගෙවිය යුතු බවට තීරණය කළ හැකි ය.''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 29අ, 29ආ, 29ඇ, 29ඈ, 29ඉ, 29ඊ, 29උ, 29ඌ, 29එ, 29ඒ, 29ඔ, 29ඕ, 29ක, 29ග, 29ච, 29ජ, 29ට, සහ 27ඩ වගන්ති වශයෙන් බලසහිත විය යුතු ය :—

'' පැහැර හැරීම කරනු ලැබ ඇති අවස්ථාවක මණ්ඩලය විසින් ක්‍රියා කිරීම.

29අ. මුල් මුදල හෝ පොලිය හෝ ඒ දෙකම සම්බන්ධයෙන් යම් ණය මුදලක් මත ලැබිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හරින කවර අවස්ථාවක වුවද පැහැර හැරීම, ණය මුදලෙන් ආපසු නොගෙවා ඇති සම්පූර්ණ කොටස සහ එතෙක් ඒ මත ලැබිය යුතුව තිබුණු පොලිය සම්බන්ධයෙන් කරන ලද පැහැර හැරීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර මණ්ඩලය විසින්, ස්වකීය අභිමතය අනුව 29ආ වගන්තියෙහි හෝ 29ඇ වගන්තියෙහි දක්වා ඇති ආකාරයට ක්‍රියා කළ හැකි ය :

එසේ වුවද මණ්ඩලය විසින් යම් කරුණක් සම්බන්ධයෙන් 29ආ වගන්තිය අනුව ක්‍රියා කර හෝ ක්‍රියා කිරීම ආරම්භ කර තිබෙන අවස්ථාවක, 29ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතයක් මගින් පසුව යම් අවස්ථාවක ඒ කරුණ සම්බන්ධයෙන් කටයුතු කිරීම සුදුසු යයි හෝ අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන්නේ නම්, එසේ ක්‍රියා කිරීමෙන් කිසියම් අවස්ථාවක දී මණ්ඩලය වළක්වනු ලබන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

උකස් කරනු ලැබූ දේපළ සන්තකයට ගැනීමට කළමනාකාර වරයාට බලය දීම.

29ආ. (1) 29උ වගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්, ලිඛිතව වාර්තාගත කරනු ලැබිය යුතු යෝජනා සම්මතයක් මගින් එම යෝජනා සම්මතයෙහි නිශ්චිත යම් තැනැත්තකුට පැහැර හැරීම කරනු ලැබ ඇත්තේ යම් ණයක් සම්බන්ධයෙන් ද, ඒ ණය සඳහා ඇපය වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ යම් නිශ්චල දේපළකට ඇතුල්වීමට හෝ ඒ දේපළ සම්බන්ධයෙන් යම් ණය ගිවිසුම්වල නියමයන් කඩ කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ දේපළ සන්තකයට ගෙන කළමනාකරණය කිරීම සහ පවත්වාගෙන යාමට ද උකස්කරු විසින් පැහැර හරිනු නො ලැබුවේ නම් හෝ ඒ ගිවිසුමේ නියමයන් කඩ කරනු නොලැබුවේ නම්, ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි වූ ඒ දේපළ පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වූ බලතල ම ක්‍රියාත්මක කිරීමට ද බලය දෙනු ලැබිය හැකි ය.

(2) යම් පිරියතක, යන්ත්‍රයක හෝ වෙනත් චංචල දේපළක ඇපය මත යම් කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යවසායක් සඳහා දෙන ලද යම් ණයක් මත බැංකුවට ලැබිය යුතු මුදල් කිසිවක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති කවර වූ විටෙක හෝ ඒ දේපළ සම්බන්ධයෙන් ණය ගිවිසුම්වල නියමයන් කඩකරනු ලැබ ඇති අවස්ථාවක, ඒ පිරියත, යන්ත්‍රය හෝ වෙනත් චංචල දේපළ පිහිටි කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යවසායට ඇතුළුවීමට සහ එය සන්තකයට ගැනීමට සහ ඒ නිශ්චල දේපළ ඔඩපනය කරනු ලැබුවේ නම් හෝ උකස් කරනු ලැබුවේ නම් ඒ ව්‍යවසාය පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ඇති බලතලම ක්‍රියාත්මක කිරීමට ලියවිල්ලකින් නිශ්චිත යම් තැනැත්තකුට මණ්ඩලය විසින් බලය දෙනු ලැබිය හැකි ය.

29ඇ. (1) යම් දේපළක් සම්බන්ධයෙන් 29ආ වගන්තිය යටතේ මණ්ඩලයේ යෝජනා සම්මතයක් මගින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට සාමාන්‍යයෙන් යෝජනා සම්මතය ප්‍රකාර ක්‍රියා කිරීමට සහ විශේෂයෙන් ම—

(අ) ඒ දේපළෙහි පලදාව විකිණීමට ;

(ආ) යම් ණයක් දෙනු ලැබුවේ යම් පිරියතක හෝ යන්ත්‍රයක ඇපය මතද ඒ ණය පැහැර හරිනු ලැබ ඇත්නම්, ඒ පිරියතින් හෝ යන්ත්‍රයෙන් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වශයෙන් නිෂ්පාදනය කරන ලද බඩු විකිණීමට ;

(ඇ) ඒ දේපළෙන් ලැබෙන කුලී, ලාභ හෝ වෙනත් ආදයම් භාර ගැනීමට ;

(ඇ) ඒ දේපළ පාලනය කිරීමේ දී සහ කළමනාකරණය කිරීමේ දී දරන ලද වියදම් ඒ දේපළෙහි ආදායමෙන් ගෙවීමට ;

(ඉ) තම සේවාවන් වෙනුවෙන් පාරිශ්‍රමිකය වශයෙන් නියම කිරීමට සුදුසු යයි මණ්ඩලය විසින් සලකනු ලබන යම් මුදලක් (වේනොත්) දේපළෙන් තමාට ලැබෙන ඒ ආදායමෙන් තමා වෙත නතුකර ගැනීමට ; සහ

(ඊ) ඒ දේපළ සම්බන්ධයෙන් වූ උකස යටතේ බැංකුවට ලැබිය යුතු සියලු මුදල් සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් හෝ (2) වන උපවගන්තිය යටතේ ඒ දේපළෙහි සන්තකය භාර දීමට මණ්ඩලය විසින් ඔහුට විධාන කරනු ලබන තෙක් හෝ ඒ දේපළෙහි සන්තකයෙහි රැඳී සිටීමට

හිමිකම ඇත්තේ ය.

(2) යම් දේපළක් සම්බන්ධයෙන් 29ආ වගන්තිය යටතේ මණ්ඩලයේ යෝජනා සම්මතයකින් බලය දෙනු ලැබූ සෑම තැනැත්තකුම විසින්—

(අ) උකස්කරුගේ නඩත්තුව සඳහා මණ්ඩලය විසින් එහි අභිමතය අනුව නියම කරනු ලබන යම් මුදලක් (වේනොත්), ඒ දේපළෙහි ආදායමෙන් මාස්පතා උකස්කරුට ගෙවිය යුතු ය ;

(ආ) මෙහි මින් පෙර බලය දෙනු ලැබූ ගෙවීම් කිරීමෙන් පසුව, ඒ දේපළෙහි ආදායමෙන් ඉතිරිව ඇති ශේෂය, මණ්ඩලය විසින් විධාන කරනු ලබන තැනැත්තකුට හෝ තැනැත්තන්ට හා එසේම විධාන කරනු ලබන ආකාරයට ත්‍රෛමාසිකව හෝ මණ්ඩලය විසින් විධාන කරනු ලබන අන්‍යාකාරයකින් ගෙවිය යුතු ය ;

(ඇ) ඒ දේපළ සම්බන්ධයෙන් ඔහු විසින් භාරගනු ලැබූ හෝ ගෙවනු ලැබූ සියලු මුදල් පිළිබඳ පැහැදිලි සහ නිවැරදි වාර්තා, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලසීමා අනුව තැබීම ද මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ද කළ යුතු ය ; සහ

(ඈ) උකස්කරුට හෝ මණ්ඩලය විසින් විධාන කරනු ලබන පරිදි වෙනත් යම් තැනැත්තකුට ඒ දේපළෙහි සන්තකය භාර දිය යුතු අතර, මෙහි මින් පෙර බලය දෙනු ලැබූ ගෙවීම් කිරීමෙන් පසුව ඒ දේපළෙහි ආදායමෙන් තම අතෙහි ඉතිරිව ඇති යම් ශේෂයක් මණ්ඩලයට ගෙවිය යුතු ය.

(3) උකස යටතේ බැංකුවට ලැබිය යුතු සියලු මුදල් සම්පූර්ණයෙන් ගෙවනු ලැබූ විට උකස් කරනු ලැබූ දේපළෙහි සන්තකය මණ්ඩලය විසින් උකස්කරුට පවාරණය කළ යුතු අතර, ඒ දේපළෙන් ලැබුණු ආදායමෙන් ඉතිරිව ඇති ශේෂය ඔහුට ආපසු දිය යුතු ය.

29ඇ. 29ඉ වගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් ණයක නොගෙවූ සම්පූර්ණ කොටස සහ විකිණීමේ දිනය දක්වා ඒ මත ලැබිය යුතු පොලිය සමග 29ඔ වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු

අයකර ගැනීම පිණිස, පැහැර හරිනු ලැබූ ඒ ණය වෙනුවෙන් ඇපය වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ යම් නිශ්චල හෝ චංචල දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට යෝජනා සම්මතයෙහි නිශ්චිතව සඳහන් යම් තැනැත්තකුට ලිඛිතව වාර්තා ගත කරනු ලැබිය යුතු යෝජනා සම්මතයක් මගින් මණ්ඩලය විසින් බලය දෙනු ලැබිය හැකි ය. තවද, ඉන් පසුව ණය ගැනුම්කරු විසින් හෝ දේපළට හෝ දේපළ සම්බන්ධයෙන් ණය ගැනුම්කරුගේ අයිතිවාසිකම, හිමිකම හෝ සම්බන්ධතාව පිළිබඳ, බැංකුව වෙත උකස් කරන ලද දිනයට අනතුරුව සාදන ලද හෝ ලියාපදිංචි කරන ලද, යම් නියාදනයක් මගින් හෝ යටතේ හිමිකම්පාන්නා වූ යම් තැනැත්තකු විසින් හෝ කවර වූ යම් හේතුවක් නිසා එකී යෝජනා සම්මතය අවලංගු කිරීමට යම් අධිකරණයක දී ඉල්ලා සිටීමට නොහැකි වන්නේ ය. තවද, එවැනි යම් ඉල්ලීමක් කිසිම අධිකරණයක් විසින් භාරගනු නොලැබිය යුතු ය.

29ඉ. (1) (2) වන උපවගන්තියෙහි සලසනු ලැබූ අන්‍යාකාර විධිවිධාන හැර, ණය ගැනුම්කරුගේ මරණය සිදුවුව ද, නැතහොත් ණය සඳහා ඇපය වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ දේපළෙහි කවර වූ හෝ යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ස්වේච්ඡාවෙන් සමර්පනය කිරීමෙන් හෝ නීතිය ක්‍රියාත්මකවීමෙන් හෝ වෙනත් යම් තැනැත්තකුට පැවරුණ ද, යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් 29ආ සහ 29ඇ වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

(2) ණය ගැනුම්කරු මියගිය විට සහ ඔහුගේ අන්තිම කැමති පත්‍රය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ ඔහුගේ බූදලය සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය යම් තැනැත්තකුට නිකුත් කරනු ලැබ නොමැති අවස්ථාවක, කොළඹ දිසා අධිකරණය විසින් හෝ ණය ගැනුම්කරු විසින් බැංකුවට උකස් කරනු ලැබූ දේපළ පිහිටි දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය විසින්, මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට සහ අධිකරණය විසින් අණකරනු ලබන පරිදි යම් තැනැත්තන් වෙතොත්, ඒ තැනැත්තන් වෙත ඉල්ලීම පිළිබඳ දැන්වීම භාරදීමෙන් පසු සහ ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය නිකුත් කිරීම හෝ අනවශ්‍ය ලෙස ප්‍රමාදවීමට ඉඩ ඇති බවට සෑහීමට පත්වන්නේ නම්, මේ වගන්තියේ කාර්ය සඳහා ණය ගැනුම්කරුගේ බූදලය නියෝජනය කිරීමට තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. තවද, ඒ ණය ගැනුම්කරුගේ බූදලය නියෝජනය කිරීමට මේ උපවගන්තිය යටතේ තැනැත්තකු පත් කරනු ලබන්නේ නම් මිස, සහ එලෙස පත් කරනු ලබන තෙක් ඒ ණය ගැනුම්කරු විසින් කරන ලද යම් පැහැරහැරීමක් සම්බන්ධයෙන් 29ආ සහ 29ඇ වගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

29ඊ. යම් දේපළක් විකිණීමට බලය දෙමින් 29ඇ වගන්තිය යටතේ වූ සෑම යෝජනා සම්මතයක් සම්බන්ධයෙන් වූ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි සහ දිනපතා පළ කෙරෙන ප්‍රවෘත්ති පත්‍රයක පළ කරනු ලැබිය යුතු ය ; තවද, ණය ගැනුම්කරු ජීවත්ව සිටින්නේ නම් ඔහු වෙත ද, ඒ දේපළ සම්බන්ධයෙන් නීතියෙන් නියමිත පරිදි, තම ලිපිනය ලියාපදිංචි කරනු ලැබූ සෑම තැනැත්තකු වෙත ද, රජයෙන් දෙනු ලැබූ බද්දක් යටතේ ඒ දේපළෙහි බදු ගැනුම්කරුවකුගේ සම්බන්ධතා සමන්විත වන්නේ නම්, ඉඩම් කොමසාරිස්වරයා වෙත ද ඒ දැන්වීමේ පිටපත් යැවිය යුතු ය.

29උ. සෑම විකිණීමක් ම සිදුවන දිනය, වේලාව සහ ස්ථානය පිළිබඳ දැන්වීමක් ඒ විකිණීම සඳහා නියම කරන ලද දිනයට දින දහහතරකට නොඅඩු කාලයකට පෙර ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු අතර ඒ දැන්වීමෙහි පිටපත්—

(අ) ණය ගැනුම්කරු ජීවත්ව සිටින්නේ නම් ඔහු වෙතද, 29ඊ වගන්තිය යටතේ යම් යෝජනා සම්මතයක් සම්බන්ධයෙන් දැන්වීමක් යැවීමට නියමිත සෑම තැනැත්තකු වෙත ද යැවිය යුතු ය ;

(ආ) විකිණීමට ඇති දේපළෙහි හෝ ඒ දේපළ අසල ඇලවිය යුතුය.

29ඌ. (1) ණය මුදලින් නොගෙවා ඇති සම්පූර්ණ මුදල් කොටස (29(2) වන වගන්තියේ අතුරු වගන්තිය යටතේ අයවිය යුතු) යම් දණ්ඩන පොලියක් හෝ වෙනත් පොලියක් ද ඇතුළුව, ඊට ගෙවිය යුතු එහි පොලිය සහ 29ඔ වගන්තිය යටතේ මණ්ඩලය විසින් අයකරගත යුතු යම් මුදල් සහ ගාස්තු වේ නම් ඒවාද සමග, විකිණීම නියම කරනු ලැබ ඇති දිනයට පෙර යම් අවස්ථාවක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත්, දේපළ නො විකිණිය යුතු අතර, එම දේපළ විකිණීම සඳහා 29ඇ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය ක්‍රියාත්මක කිරීමෙහි ලා තවදුරටත් කිසිම පියවරක් නොගත යුතු ය.

(2) ගෙවීම පැහැර හරිනු ලැබුවේ යම් වාරික මුදලක්, සෑමයු ගෙවීමක් හෝ වෙනත් ගෙවීමක් සම්බන්ධයෙන් ද, ඒ මුදල (29(2) වගන්තියේ අතුරු වගන්තිය යටතේ අයවිය යුතු) හා ඊට ගෙවිය යුතු යම් දණ්ඩන පොලියක් හෝ වෙනත් පොලියක් ද 20ඔ වගන්තිය යටතේ මණ්ඩලය විසින් අයකර ගතයුතු යම් මුදල් සහ ගාස්තු වේ නම් ඒවාද සමග විකිණීම සඳහා නියම කරනු ලැබ ඇති දිනයට පෙර යම් අවස්ථාවක දී මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත්, දේපළ නො විකිණිය යුතු යයිද, එම දේපළ විකිණීම සඳහා 29ඇ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය ක්‍රියාත්මක කිරීමෙහි ලා තවදුරටත් කිසිම පියවරක් නොගත යුතු යයි ද ස්වකීය අභිමතය අනුව බැංකුව විසින් විධාන කරනු ලැබිය හැකි ය.

29එ. බැංකුව හැර වෙනත් යම් තැනැත්තකුට යම් අඩුම වෙන්දේසි මිලකට අඩුවෙන් නොවිකිණිය යුතු වන්නේ ද එම මිල මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි ය.

29ඒ. (1) එකම දේපළක් ඇපය වශයෙන් ඇතිව බැංකුව විසින් ණය දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් දෙනු ලැබ ඇත්තා වූ සහ ඒ ණයවලින් එකක් හෝ වැඩි ගණනක් සඳහා ලැබිය යුතු යම් මුදලක් ගෙවීම සම්බන්ධ-යෙන් පැහැරහැරීමක් කරනු ලබන යම් අවස්ථාවක දී, වෙනත් ණය හෝ වෙනත් ණය අතුරින් කිසිවක් සම්බන්ධයෙන් පැහැරහැරීමක් කරනු නොලැබුවද මේ පනතේ ඉහතින් වූ විධිවිධාන අදාළ විය යුතු ය. තවද මණ්ඩලය විසින් එවැනි යම් අවස්ථාවක දී 29ඇ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයක් මගින්, අවස්ථාවෝචිත පරිදි, ඒ ණය දෙකම හෝ සියලු ණය සම්බන්ධයෙන් බැංකුවට ලැබිය යුතු මුළු මුදල අයකර ගැනීම සඳහා දේපළ විකිණීමට බලය දෙනු ලැබිය හැකි අතර, මේ පනතේ මේ කොටසේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

(2) 29අ වගන්තියේ සිට 29ජ වගන්තිය (වගන්ති දෙකම ඇතුළුව) දක්වා වූ වගන්තිවල ඇතුළත් කිසිවකින් උකස්කරයක් මත ලැබිය යුතු මුදල්, මණ්ඩලය විසින් වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව අයකර ගැනීමෙන් වළක්වනු නොලැබිය යුතු ය.

29ඔ. යම් ණයක් මත ලැබිය යුතු මුදලට අතිරේකව, ණයකරුගෙන් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකුගෙන්, මණ්ඩලය විසින්—

(අ) ණය දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් ලියා අත්සන් කරනු ලැබූ උකස්කරයෙහි ඇතුළත් ප්‍රතිඥප්තිවලට අනුකූලව, බැංකුවට උකස් කරන ලද දේපළ මත බලාන්විත කරන ලද යම් රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් වූ වාරික සහ වෙනත් ගාස්තු ගෙවීමේ දී සහ ණයකරු විසින් ලියා අත්සන් කරනු ලැබූ ඒ උකස්කරයෙහි ඇතුළත් ප්‍රතිඥප්ති යටතේ බැංකුව විසින් දරනු ලැබීමට බලය දෙන ලද වෙනත් සියලු වියදම් සහ ගාස්තු ගෙවීමේ දී බැංකුව විසින් වියදම් කරන ලද සියලු මුදල් ;

(ආ) උකස් කරන ලද දේපළ විකිණීම සම්බන්ධයෙන් ප්‍රචාරක දැන්වීම් පළකිරීමේ සහ ඒ දේපළ විකිණීමේ ගාස්තු ; සහ

(ඇ) ණය සඳහා ඇපය වශයෙන් උකස් කරන ලද දේපළ රජයෙන් ලබාගත් බද්දක් යටතේ ණයකරුගේ සම්බන්ධතාව සමන්විත වන්නා වූ ද, 29ට වගන්තියේ විධිවිධාන වලට අනුකූලව ඒ දේපළ රජයට පවාරණය කර ඇත්තා වූ ද යම් අවස්ථාවක එකී බද්ද යටතේ ණයකරුගෙන් රජයට ලැබිය යුතු මුදල් වශයෙන් ඒ පවාරණය මත මණ්ඩලය විසින් රජයට ගෙවන ලද සියලු මුදල් අයකර ගනු ලැබිය හැකිය :

එසේ වුව ද (ආ) ඡේදය යටතේ දරන ලද ගාස්තු මණ්ඩලයේ යෝජනා සම්මතයක් මගින් කලින් කල නියම කරනු ලබන ණයෙහි ප්‍රතිශතය නො ඉක්මවිය යුතු ය.

29ඕ. උකස් කරනු ලැබූ දේපළ විකුණනු ලැබුවහොත්, උකස මත ලැබිය යුතු මුදල සහ 29ඔ වගන්තිය යටතේ අයකර ගනු ලබන මුදල් සහ ගාස්තු, විකිණීමෙන් ලත් මුදලින් අඩුකර ගැනීමෙන් පසුව, ඉතිරිවන ශේෂයක් වෙතොත්, ඒ ශේෂය ණයකරුට හෝ ණයකරුට ලැබිය යුතු ගෙවීම භාර ගැනීමට නීත්‍යානුකූල හිමිකම ඇති යම් තැනැත්තකුට හෝ බැංකුව විසින් ගෙවිය යුතු ය. නැතහොත් මුදල් ගෙවිය යුත්තේ කවර-කුටදැයි මණ්ඩලයට යම් සැකයක් ඇති විටක, උකස් කරනු ලැබූ දේපළ පිහිටියේ යම් දිස්ත්‍රික්කයක ද ඒ දිස්ත්‍රික්කයේ දිසා අධිකරණයට ඒ මුදල මණ්ඩලය විසින් ගෙවිය යුතු ය.

29ක. (1) උකස් කරනු ලැබූ දේපළ විකුණනු ලැබුවහොත්, මණ්ඩලය විසින් විකිණීම පිළිබඳ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර, එවිට ඒ දේපළට සහ ඒ දේපළ සම්බන්ධයෙන් ණයකරුට ඇති සියලු අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතාව ගැනුම්කරු වෙත සතු විය

යුතු ය. තවද, ඉන් පසුව දේපළට සහ දේපළ සම්බන්ධයෙන් ණයකරුගේ කවර වූ හෝ අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පිළිබඳව, දේපළ බැංකුව වෙත උකස් කළ දිනයට අනතුරුව කරන ලද හෝ ලියාපදිංචි කරන ලද යම් නීයාදනයක් මගින් හෝ ඒ යටතේ හිමිකම් පාන යම් තැනැත්තකුට කවර වූ යම් හේතුවක් නිසා විකිණීම අවලංගු කිරීමට හෝ ගැනුම්කරුට විරුද්ධව දේපළට හෝ දේපළ සම්බන්ධයෙන් යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පවත්වා ගෙන යාමට හෝ යම් අධිකරණයක දී ඉල්ලා සිටිය නොහැකි විය යුතු ය.

(2) යම් දේපළක් විකිණීම සම්බන්ධයෙන්, (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් අත්සන් කරන ලද සහතිකයක්, එම දේපළ විකිණීමට අදාළව මේ පනතේ සියලු විධිවිධාන අනුව කටයුතු කරනු ලැබූ බවට තීරණාත්මක සාක්ෂිය විය යුතු ය.

(3) ගැනුම්කරු බැංකුව හැර වෙනත් යම් තැනැත්තකු වන්නේ නම්, සහතිකය, නියමිත ආකෘතියට සාරානුකූල විය යුතු ය. තවද, ගැනුම්කරු බැංකුව වන්නේ නම් සහතිකය නියම කරනු ලබන වෙනත් ආකෘතියකට සාරානුකූල විය යුතු ය.

(4) විකිණීම පිළිබඳ සෑම සහතිකයක් ම, නිශ්චල දේපළ සමර්පනය කිරීමක් වූවාක් ලෙස මුද්දර ගාස්තුවට හා අයකිරීම්වලට සහ නීතියෙන් බලය දෙනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහ වෙනත් ගාස්තුවලට යටත් විය යුතු අතර, එකී සියලු ගාස්තු හා අය කිරීම් ගැනුම්කරු විසින් ගෙවිය යුතු ය.

(5) විකුණනු ලැබූ දේපළ රජයෙන් ලබාගත් බද්දක් යටතේ බදු ගැනුම්කරුවකුගේ සම්බන්ධතාවයකින් සමන්විත වන අවස්ථාවක, එවිට, දේපළෙහි ගැනුම්කරු බැංකුව හැර වෙනත් යම් තැනැත්තකු වන්නේ නම්, තම අභිමතය ක්‍රියාත්මක කිරීමෙහි ලා ඉඩම් කොමසාරිස්වරයා විසින් ගැනුම්කරු අනුමත කරනු ලැබ ඇත්නම් මිස, විකිණීම පිළිබඳ සහතිකය මණ්ඩලය විසින් අත්සන් කරනු නොලැබිය යුතු ය.

(6) රජයෙන් ලබාගත් බද්දක් යටතේ වූ බදු ගැනුම්කරුවකුගේ සම්බන්ධතාව සම්බන්ධයෙන් යම් ගැනුම්කරුවකු අනුමත කිරීමට (5) වන උපවගන්තිය යටතේ ඉඩම් කොමසාරිස්වරයා ප්‍රතික්ෂේප කරන කවර වූ අවස්ථාවක—

(අ) විකිණීම සම්බන්ධයෙන් ගැනුම්කරු විසින් බැංකුවට ගෙවන ලද සියලු මුදල් මණ්ඩලය විසින් ඔහුට ආපසු ගෙවිය යුතු ය ;

(ආ) ඒ විකිණීම පිළිබඳ ප්‍රචාරක දැන්වීම් පළකිරීමේ සහ ඒ විකිණීම පැවැත්වීමේ වියදම් 27ඔ වගන්තිය යටතේ මණ්ඩලය විසින් අයකර ගනු ලැබිය යුතු ගාස්තු ලෙස සලකනු ලැබිය යුතු ය ; තවද

(ඇ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව දේපළ නැවත විකුණනු ලැබිය යුතු ය.

29ග. (1) මේ පනතේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව විකුණන ලද යම් නිශ්චල දේපළක ගැනුම්කරු විසින්, කොළඹ දිසා අධිකරණය වෙත නැතහොත් ඒ දේපළ පිහිටියේ යම් ස්ථානයක ද ඒ ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සහ 29ක වගන්තිය යටතේ එම දේපළ සම්බන්ධයෙන් නිකුත් කරන ලද විකිණීම පිළිබඳ සහතිකය ඉදිරිපත් කරනු ලැබූ විට, එම දේපළෙහි සන්තකය භාරදීමේ ආඥාවකට ඒ ගැනුම්කරුට හිමිකම ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් ම, සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ලඝු කාර්ය පටිපාටිය අනුව කරනු ලැබිය යුතු අතර, එ ලෙස සුදුස්සක් කරනු ලැබිය යුතුය. තවද ඒ එක් එක් ඉල්ලීමෙහි කාර්යය සඳහා ඉදිරිපත් කෙරෙන සියලු ලේඛන වෙනුවෙන් සහ ඒ සම්බන්ධයෙන් පැවැත්වෙන සියලු නඩු කටයුතු වෙනුවෙන්, එම ඉල්ලීම අදාළ වන්නේ යම් දේපළකට ද එහි වටිනාකමට සමාන වටිනාකමක් ඇති යම් නිශ්චල දේපළක සන්තකය භාර දීම සඳහා දිසා අධිකරණයක තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ඉල්ලීම වෙනුවෙන් සහ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ හෝ ආනුෂංගික නඩු කටයුතු වෙනුවෙන් තත්කාලයෙහි වලංගුව පවත්නා යම් ලිඛිත නීතියක් යටතේ පිළිවෙලින් ගෙවිය යුතු අනුප්‍රමාණයන් අනුව මුද්දර ගාස්තු සහ වෙනත් අයකිරීම් ගෙවිය යුතු ය.

(3) මේ පනතේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව විකුණනු ලැබූ යම් නිශ්චල දේපළක් ණයකරු විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් හෝ බැංකුවට එම දේපළ උකස් කිරීමට අනතුරුව, ණයකරු විසින් ඇති කරන ලද හිමිකමක් යටතේ හිමිකම්පාන යම් තැනැත්තකු විසින් හෝ පදිංචියට ගෙන ඇති අවස්ථාවක, දිසා අධිකරණය විසින් ගැනුම්කරුට හෝ ඔහු වෙනුවෙන් දේපළෙහි සන්තකය භාර ගැනීමට ඔහු විසින් පත් කරනු ලබන යම් තැනැත්තකුට දේපළෙහි සන්තකය භාරදිය යුතු යැයි ආඥා කරනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව විකුණනු ලැබූ යම් නිශ්චල දේපළක් කුලී නිවැසියකු විසින් හෝ එහි පදිංචියට හිමිකම් ඇති වෙනත් තැනැත්තකු විසින් හෝ පදිංචියට ගෙන ඇති අවස්ථාවක, විකිණීම සිදුවූ බවට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් දැන්වීමක්, දේපළෙහි ප්‍රකට ස්ථානයක ඇලවීමෙන් සහ ණයකරුගේ සම්බන්ධතාවය ගැනුම්කරුට පවරන ලද බවට පහසු ස්ථානයක දී ව්‍යවහාරික ක්‍රමයෙන් හෝ අධිකරණය විසින් විධාන කරනු ලබන වෙනත් ක්‍රමයකින් පදිංචිකරුට ප්‍රකාශනය කිරීමෙන් භාරදීම කරනු ලැබිය යුතු බවට දිසා අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය යුතු ය. ඒ ප්‍රකාශනයේ වියදම අධිකරණය විසින් නියම කළ යුතු අතර, සෑම අවස්ථාවක දීම ගැනුම්කරු විසින් එය කලින් ගෙවනු ලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය යටතේ වූ සෑම ආඥාවක් ම, අවස්ථාවෝචිත පරිදි, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 287 වන හෝ 288 වන වගන්තිය යටතේ කරන ලද සන්තකය භාරදීම සඳහා වූ ආඥාවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම සංග්‍රහයේ යම්

විධිවිධානයක් අදාළ කිරීමේ කාර්යය සඳහා ණයකරු සහ ගැනුම්කරු පිළිවෙලින් විනිශ්චිත ණයකරු සහ විනිශ්චිත ණයහිමියා ලෙස සලකා එසේ කරන ලද ආඥාවක් මෙන් සමාන ආකාරයකින් බලාත්මක කරනු ලැබිය හැකි ය.

29ච. විකුණනු ලැබූ දේපළ බැංකුව වෙනුවෙන් මිලට ගෙන ඇති අවස්ථාවක, මණ්ඩලය විසින්, ඒ දේපළ නැවත විකිණීමට පෙර යම් අවස්ථාවක, ඒ දේපළ විකුණනු ලැබුවේ යම් ණයක් සම්බන්ධයෙන් ද ඒ ණය සම්බන්ධයෙන් ලැබිය යුතු මුදල (තහනමට ගැනීමේ සහ විකිණීමේ ගාස්තු ඇතුළුව) සහ වර්ෂයකට නියමිත අනුප්‍රමාණය නොඉක්මවන අනුප්‍රමාණයක් අනුව මුළු මුදල මත පොලිය ණයකරු විසින් හෝ ඔහු වෙනුවෙන් යම් තැනැත්තකු විසින් හෝ ගෙවනු ලැබූ විට, විකිණීම පිළිබඳ සහතිකයේ සහතික පිටපතක් මත ඒ බවට පිටසනක් කිරීමෙන් විකිණීම අවලංගු කරනු ලැබිය හැකි ය. එවැනි පිටසනක් ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා ගේ කාර්යාලයෙහි ලියාපදිංචි කරනු ලැබූ විට, විකිණීම මේ පනත යටතේ කවරදු හෝ කරනු නොලැබූ ලෙස ණයකරු වෙත එකී දේපළ නැවත සතු වන්නේ ය.

20ජ. එසේ විකුණනු ලැබූ දේපළ බැංකුව වෙනුවෙන් මිලට ගනු ලැබ, 29ච වගන්තිය යටතේ විකිණීම අවලංගු කරනු ලැබ නොමැති නම්, මණ්ඩලය විසින් යම් අවස්ථාවක දී දේපළ නැවත විකුණා 29ක වගන්තියේ (3) වන උප වගන්තියේ සඳහන් සහතිකයේ සහතික පිටපතක් මත පිටසනක් කිරීමෙන් ගැනුම්කරු විසින් මුල් විකිණීමේ දී අත්කර ගනු ලැබිය හැකි වූ සියලු අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ගැනුම්කරුට පවරා දෙනු ලැබිය හැකි ය. මුල් විකිණීමේ දී ගැනුම්කරුවකුට දෙන සහතිකයට අවශ්‍ය ප්‍රමාණයේම මුද්දර ගාස්තුවට සහ අයකිරීම්වලට ඒ පිටසන යටත් විය යුතු අතර, එය ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයෙහි ලියාපදිංචි කරනු ලැබූ විට, ඉහත කී පරිදි ඒ අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ගැනුම්කරු වෙත සතුවිය යුතුය.

29ට. මේ පනතේ ඉහතින් වූ විධිවිධානවලට අනුව වූ යම් විකිණීමක දී ණයක් ආපසු ගෙවීම පැහැර හැරීම නිසා, විකුණන ලද යම් දේපළක් බැංකුව විසින් මිලට ගෙන ඇතොත්, ණය, පොලිය, වියදම් සහ ගාස්තු සම්බන්ධයෙන් බැංකුවට ලැබිය යුතු මුළු මුදල පියවෙන යම් මුදලක් සඳහා එම දේපළ නැවත විකිණීමට බැංකුවට හැකිවීම පිණිස අවශ්‍ය කාලයට වඩා දීර්ඝ කාලයක් බැංකුව විසින් ඒ දේපළ තබා ගැනීම නොකළ යුතු ය ;

එසේ වුවද ඒ දේපළ රජයෙන් ලබාගත් බද්දක් යටතේ බදු ගැනුම්කරුවකුගේ සම්බන්ධතාවකින් සමන්විත වන අවස්ථාවක, ඒ දේපළ නැවත විකිණීම වෙනුවට, මණ්ඩලය, අමාත්‍යවරයා සහ රජයේ ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා අතර එකඟ වන නියමයන් සහ කොන්දේසි මත, මණ්ඩලය විසින් රජයට එම බද්ද, පවරාණය කරනු ලැබිය හැකි ය.

29ඩ. මේ කොටසෙහි, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, රජයෙන් ලබාගත් බද්දක් යටතේ වූ බදු ගැනුම්කරුවකුගේ සම්බන්ධතාවය උකස් කිරීමකින් ණයක් සුරක්ෂිත කරනු ලැබ ඇති යම් අවස්ථාවක, '' දේපළ '' යන්නෙන් බද්ද යටතේ බදු ගැනුම්කරුගේ අයිතිවාසිකම, හිමිකම සහ සම්බන්ධතාවය අදහස් වේ.''.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) '' අනුමත කළ සමිති '' යන යෙදුමේ අර්ථකථනයට පෙරාතුවම, පහත දක්වෙන අලුත් අර්ථකථන ඇතුළත් කිරීමෙන් :—

' '' කෘෂිකර්මය '' යන්නට භෝග, ඖෂධීය ශාක සහ පැලෑටි වගාව, උයන් වතු වැවීම, පට පණුවන් බෝකිරීම, මීමැසි පාලනය, වන විද්‍යාව, සතුන් ඇති කිරීම, කුකුළන් ආදී සතුන් ඇති කිරීම සහ සතුන් ඇති කිරීම සහ බෝකිරීම, තණ බිම් සහ සත්වාහාර වගා කිරීම හා නිෂ්පාදන අලෙවි කිරීම ඇතුළු කිරිපට්ටි පාලනය ඇතුළත් වේ ;

'' කෘෂිකාර්මික ව්‍යවසාය '' යන්නෙන් යම් කෘෂිකාර්මික, උයන් වතු වැවීම හෝ යම් සත්ව නිෂ්පාදන නිපදවීමේ කාර්යය සඳහා වූ ව්‍යවසායක් අදහස් වන අතර, සතුන් හෝ කුකුළන් ආදී සතුන් ඇති කිරීමේ කාර්යය සඳහා වූ ව්‍යවසායක් ඊට ඇතුළත් වේ ;';

(2) '' අනුමත කළ සමිති '' යන යෙදුමේ අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' '' අනුමත කළ ණය ආයතනය '' යන්නෙහි (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 88ඊ වගන්තියෙහි '' ණය ආයතනය '' යන්නට දී ඇති අර්ථයම ඇති අතර, මේ පනතේ කාර්ය සඳහා අනුමත කළ ණය ආයතන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන වෙනත් ආයතන ඊට ඇතුළත් වේ ;';

(3) ''ගොවි කාරක සභාව'' යන යෙදුමේ අර්ථකථනය අත් හැරීමෙන්.

(4) '' සමුපකාර සමිතිය '' යන යෙදුමේ අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' '' ව්‍යවසාය '' යන්නෙන් කවර වූ යම් නාමයකින් හෝ අභිධානයකින් හඳුන්වනු ලබන සංස්ථාගත හෝ සංස්ථාගත නොවූ යම් පුද්ගල මණ්ඩලයක් අදහස් වන අතර, ඒකපුද්ගල සංස්ථාවක් හෝ ඒකපුද්ගල අයිතිය ඇති ආයතනයක්ද ඊට ඇතුළත් වේ ; ' ;

(5) '' බැංකුවේ ප්‍රධාන මණ්ඩලය '' යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' '' කර්මාන්තය '' යන්නට මසුන් ඇල්ලීම, මැණික් ගැරීම, සංචාරක ව්‍යාපාරය, ප්‍රවාහනය සහ වෙළෙඳපොලෙහි විකිණීම සඳහා යම් නිෂ්පාදනයක් හෝ වෙළෙඳ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම හෝ පිළියෙල කිරීම ඇතුළත් වේ ;

" කාර්මික ව්‍යවසාය " යන්නෙන්—

(අ) යාන්ත්‍රික ක්‍රම මගින් යම් භාණ්ඩ, බඩු හෝ ද්‍රව්‍ය සෑදීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා වූ නැතහොත් යාන්ත්‍රික ක්‍රම මගින් යම් භාණ්ඩ, බඩු හෝ ද්‍රව්‍ය යම් කාර්යාවලියකට යටත් කිරීම සඳහා වූ හෝ කැනීම සඳහා වූ හෝ මුද්‍රණය කිරීම සඳහා වූ හෝ යන්ත්‍ර හෝ වාහන හෝ යාත්‍රා අලුත්වැඩියා කිරීම සඳහා වූ ව්‍යවසායක් ; සහ

(ආ) තැනැත්තන් හෝ බඩු ප්‍රවාහනය කිරීම සඳහා වූ ව්‍යවසායක්

අදහස් වේ ; ' ;

"ණය" යන්නෙන් ණය මුදලක් අදහස් වන අතර යම් අයිරාවක් හෝ අත්තිකාරමක් හෝ කවර වුවද නාමයකින් නැතහොත් අභිධානයකින් හඳුන්වනු ලබන වෙනත් කවර වුවද මූල්‍ය පිළිසරණක් ඊට ඇතුළත් වේ." ;

(6) " මධ්‍යම කාලීන ණය " යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' " නියමිත " යන්නෙන් මේ පනත යටතේ සාදන ලද රීති මගින් නියමිත බව අදහස් වේ.'.

## 1986 අංක 45 දරන විසර්ජන පනත

**1987 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1986 අංක 45 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (1) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි " 1987 මුදල් වර්ෂය " යනුවෙන් සඳහන් කරනු ලබන 1987 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භව 1987 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි තක්සේරු කර ඇති රුපියල් පනදහස් පන්සිය හැත්තෑ හයකෝටි අනුලක්ෂ අනූදහසක් වූ ආණ්ඩුවේ වියදම—

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින් ; හා

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් දෙදහස් හත්සිය අසූඅට කෝටි පනස් ලක්ෂයක් නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල්වලින්

පියවිය යුතුය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් පන්දහස් පන්සිය හැත්තෑ හයකෝටි අනුලක්ෂ අනුහත්-දහසක් වූ මුදල මේ පනතේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන අන්කිසි ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බලපැවැත්විය යුතු ය.

3. (1) 1987 මුදල් වර්ෂය තුළ දී, මේ පනතෙහි දෙවන උප ලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්තෙන් ආණ්ඩුවට ලැබෙන ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැර කළ යුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම්වල සමස්තය එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනෙහි දක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතු ය. එවැනි කටයුත්තකින් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම් එය 1987 මුදල් වර්ෂය අවසන්වී හය මාසයක් ඉකුත්වීමට පෙර ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිගමනය කිරීමේ කාර්යය සඳහා පහත දක්වෙන ගෙවීම්, එනම් :—

(අ) කිසියම් කටයුත්තක ආදයමට අයවිය යුතුව, නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපන හා වෙනත් වියදම් ; සහ

(ආ) කිසියම් කටයුත්තක නිශ්චල හා චංචල දේපළ වෙනුවෙන් ක්ෂයවීම ආවරණය සඳහා ප්‍රතිපාදන

ඒ එක් එක් කටයුත්තක ආදයමින් අඩු කළ යුතු ය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 1987 මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම්, ඒ මුදල් වර්ෂය තුළ දී එම කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්වලින් ගෙවිය යුතු ය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ II වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

(4) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන්, 1987 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, එම උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය. තවද, ඒ මුදල් වර්ෂයේ අවසානයේ දී එම කටයුත්තේ මුළු බැරකම්, එම උපලේඛනයේ V වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

4. 1987 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුවට ලැබෙන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා අවශ්‍යයයි අමාත්‍යවරයා සලකන මුදල්, ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි හෝ වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකි ය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්තය එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතු ය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක්, අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතු ය.

**5.** (1) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දක්වෙන යම් වැඩසටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට එම උපලේඛනයෙහි විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකරන ලද්ද වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද යම් මුදලක් එම වැඩ සටහනේ ම මූලධන වියදමේ වෙන් කිරීමකට හෝ එම ශීර්ෂයේ ම වෙන යම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ වෙන් කිරීමකට හෝ භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකි ය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතු ය.

**6.** (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩුවිය හැකි බවට ; හෝ

(2) යම්කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට

අමාත්‍යවරයා සෑහීමකට පත්වන අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදහරින ලද මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ඉවත්කර ගැනීම අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කරනු ලැබිය හැකි ය.

**7.** අමාත්‍යවරයා විසින්, ආණ්ඩුවේ අනුමතය ඇතිව—

(අ) මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයෙහි, VI වන තීරයෙහි සහ V වන තීරයෙහි දක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක් ;

(ආ) මේ පනතේ දෙවන උපලේඛනයේ III වන තීරයෙහි දක්වෙන අවම සීමා,

නියමයක් මගින්, 1988 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර, වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් එය අනුමත කර ඇත්නම් මිස, බල නොපැවැත්විය යුතු ය.

එවැනි කිසියම් නියමයක්, එහි එසේ ප්‍රකාශිතව සඳහන් කරනු ලැබුවහොත්, ඒ නියමය කරනු ලැබූ දිනයට කලින් වූ සහ එහි දක්වනු ලබන දිනයක සිට බලපැවැත්වූ ලෙස සැලකිය යුතු ය.

**8.** පාර්ලිමේන්තුව විසින්, යෝජනා සම්මතයක් මගින්, මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ—

(අ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් ;

(ආ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකි ය.